# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1538 / 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி | දිනය<br>Date | 08/12/2023<br>පැය 0830 |

# මාධ්‍ය නිවේදනය

## 01. වෙඩි වැදී තුවාල වීමක් - මහඔය පොලිස් වසම.

2023.12.07 වන දින රාත්‍රී කාලයේ මහඔය පොලිස් වසමේ මුඩගල ප්‍රදේශයේදී පුද්ගලයෙකුට වෙඩි වැදීමක් හේතුවෙන් තුවාල ලබා මහඔය රෝහලට ඇතුලත් කර ඇති බවට මහඔය පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**තුවාලකරු වයස අවුරුදු 33 ක් වන දඹදෙනිය, මහඔය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පසුව සිදුකළ විමර්ශනයේදී 2023.12.07 වන දින රාත්‍රී කාලයේදී මුඩගල ප්‍රදේශයේ පිහිටි පැමිණිලිකරුගේ ගව ගාල දෙසින් ගවයින් කෑගසන ශබ්දයක් ඇසෙන බවට අසල්වාසියෙකු විසින් ලබා දුන් පණිවිඩයකට අනුව ගව ගාලේ හිමිකරු සහ තවත් පුද්ගලයෙකු සමඟ යතුරු පැදියකින් එය පරීක්ෂා කිරීම සඳහා එම ස්ථානයට ගමන් කර ඇත.

මෙලෙස ගවගාල අසලට මදක් දුරින් පිහිටි ගල් තලාවක් මත පුද්ගලයන් සිවු දෙනෙකු සිට මොවුන් දෙදෙනා දැක පලා යාමට උත්සාහ කර ඇති අතර, ඉන් දෙදෙනෙකු මොවුන් විසින් අල්ලා ගෙන ඇත. අල්ලා ගත් දෙදෙනා සමඟ මොවුන් දෙදෙනා නැවත ගව ගාල දෙසට එමින් සිටියදී කිසිවෙකු විසින් එම අවස්ථාවේ වෙඩි තැබීමක් සිදුකර පලාගොස් ඇත. වෙඩි තැබීම හේතුවෙන් ගව ගාලේ හිමිකරුගේ සහායට පැමිණි පුද්ගලයාට වෙඩි වැදී මහඔය රෝහලට ඇතුලත් කිරීමෙන් අනතුරුව වැඩිදුර ප්‍රතිකාර සඳහා අම්පාර රෝහල වෙත මාරු කර යවා ඇත.

සිද්ධිය සම්බන්ධයෙන් මහඔය පොලීසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 02. මිනිස් අස්ථි කොටස් හමුවීමක් - මාතර පොලිස් වසම.

2023.12.06 වන දින උදෑසන කාලයේදී මාතර පොලිස් වසමේ මාතර කොටුව තුල පිහිටි මැතිවරණ ලේකම් කාර්යාලය ඉදිරිපිට මාර්ගයේ විදුලි බල මණ්ඩලයේ නිලධාරීන් විසින් විදුලි රැහැන් කණුවක් සිටුවීමට වලක් හාරමින් සිටියදී මිනිස් අස්ථි කොටස් යැයි සිතිය හැකි කොටස් හමුවූ බවට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත

දැනුවත් කිරීමෙන් අනතුරුව එම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් පොලිස් ස්ථානය දැනුවත් කිරීමෙන් පසු ඒ සම්බන්ධව විමර්ශන ආරම්භ කර මාතර ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත කරුණු වාර්තා කර තිබිණි. මාතර තාරකා කොටුව කෞතුකාගාරයේ තැන්පත්කර තිබූ අස්ථි කොටස් හා කැණීම් කල ස්ථානය මාතර මහේස්ත්‍රාත්තුමා විසින් පරීක්ෂා කර ඇත.

මිනිස් අස්ථි කොටස්, පෝසිලේන් කොටස්, දුම් බටයක් හා මැටි භාන්ඩ කොටස් කිහිපයක් මෙලෙස හමුවී ඇති අතර, එම කොටස් කෞතුකාගාරයේ තබන ලෙස අධිකරණය විසින් දැනුම් දී ඇති අතර, මෙම අස්ථි කොටස් හමුවූ ස්ථානයේ තවදුරටත් කැණීම් කිරීම සඳහා පුරා විද්‍යා නිලධාරීන් හට නියෝග කර ඇත. මෙම දේපල සහ අස්ථි කොටස් ලන්දේසි යුගයට අයත් බවට පුරාවිද්‍යා නිලධාරීන් විසින් ප්‍රකාශ කර ඇත.

මාතර පොලීසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. විදේශ රටක නිෂ්පාදිත බෝර 12 වර්ගයේ ගිනි අවියක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - ඌව කුඩාඔය පොලිස් ස්ථානය.

2023.12.07 වන දින සවස් කාලයේ ඌව කුඩාඔය පොලිස් වසමේ පතානයාය ප්‍රදේශයේදී ඌව කුඩාඔය පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **විදේශ රටක නිෂ්පාදිත බෝර 12 වර්ගයේ ගිනි අවියක් සහ එම පතරොම් 10 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වන ඌව කුඩාඔය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ඌව කුඩාඔය පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

## 04. මෙරට නිෂ්පාදිත ගිනි අවි 02 ක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - වැලිගෙපොල පොලිස් ස්ථානය.

2023.12.07 වන දින උදැසන කාලයේ වැලිගෙපොල පොලිස් වසමේ යටිපස්ගමුව ප්‍රදේශයේදී වැලිගෙපොල පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවි 02 ක්** සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 37 ක් වන වැලිගෙපොල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

වැලිගෙපොල පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

## 05. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - මාතලේ පොලිස් ස්ථානය.

2023.12.07 වන දින සවස් කාලයේ මාතලේ පොලිස් වසමේ කොහොඹිලිවෙල ප්‍රදේශයේදී මාතලේ පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සමඟ සැකකරුවකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 53 ක් වන මාදිපොල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මාතලේ පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**